# රේගු අතිකාල සහ නැව් බඩු පරීක්ෂණ ගාස්තු අරමුදල

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 විගණන මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට රේගු අතිකාල හා නැව් බඩු පරීක්ෂණ ගාස්තු අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) BOV-CTV- ඔරුගොඩවත්ත නමින් 2002 හා 2004 වර්ෂයන්ට අදාලව පිළිවෙලින් රු.611,156 ක් හා රු 534,773 ක් වු ණය ගැති ශේෂ එම ආයතනයට අදාල ජල බිල්පත් සඳහා හිලව්කර ඇති බවට වාර්තාකර තිබුණද, ඒ සඳහා අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.

එසේම, 2005 වර්ෂයට අදාලව එම ආයතනයෙන් ලැබිය යුතු රු 1,097,245 ක ශේෂය 2008 වර්ෂය තුල විධිමත් විමර්ශනයකින් සහ අනුමැතියකින් තොරව සමුච්චිත අරමුදලින් කපාහැර ඇතත්, එම මුදල තුල ඒකාබද්ධ අරමුදලින් දැරිය යුතු රු. 708,656 ක ජල හා විදුලි බිල්පත් වියදම් ද ඇතුලත් විය. මෙම වරද 2010 වර්ෂය තුළදීද පෙන්වාදෙන ලදි.

#### 1.2.2 හඳුනා නොගත් ගනුදෙනු

වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එන රු. 7,017,198 ක් සහ රු.1,730,375 ක් වු පිළිවෙලින් ජංගම වත්කම් හා ජංගම බැරකම් ශේෂ 08 ක් හඳුනා ගෙන නිරවුල් කිරීමට ක්‍රියාකර නොතිබුණි.මේ පිළිබඳව 2008, 2009 හා 2010 වර්ෂවල විගණන වාර්තා මගින්ද පෙන්වා දී තිබුණි. ඒ සඳහා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පිළිතුර වුයේ ඊළග වර්ෂය තුලදී එය නිරවුල් කිරීමට කටයුතු කරන බවයි. එහෙත් 2011 වර්ෂය තුලදී ද එය නිරවුල් කිරීමට ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### 1.2.3 ලැබිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන වල දැක්වූ රු.40,839,267 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ තුල රු. මිලියනය ඉක්ම වූ එකතුව රු.16,960,226 ක් වටිනා ණය ගැති ශේෂ 07 ක් පැවති අතර, එය මුළු හිඟ ශේෂ වලින් 41.53% ක් විය. කෙසේ වුවද 2012 ජූනි 30 වන විට මෙම ණය ගැතියන්ගේ හිඟ ණය ශේෂවල එකතුව රු. 7,663,201 ක් විය.

(ආ) මුළු ණය ගැතියන්ගෙන් රු.12,460,515 ක් එනම් 30.51% ක් වර්ෂ 7 කටත් වඩා පැරණි ශේෂයන් වන අතර, ඒ අතරින් රු.6,459,537 ක් හෙවත් 51.84% ක් වසර 20 කටත් වැඩි කාලයක සිට හිඟව පැවතුණි. අයවීම අවිනිශ්චිත තත්ත්වයේ වූ එම ශේෂයන් සඳහා ප්‍රමාණවත් බොල්ණය ප්‍රතිපාදනද සලසා නොතිබුණි. වර්ෂ 7 කටත් වැඩි කාලයක සිට පවතින ණයගැතියන්ගෙන් අදාල මුදල් අයකර ගැනීම සඳහා ප්‍රවර්තන වර්ෂයේදී ද විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එසේම, ණයගැතියන් ලෙස දක්වා ඇති ඇතැම් ආයතනවල පැවැත්ම පිළිබඳවද සොයා බලා ඇති බවක් ද නිරීක්ෂණය නොවීය.

(ඇ) ඇතැම් ණය ගැති ශේෂයන්ට අදාලව ඇප තැන්පත් ලබාගෙන නොතිබුණි.

### 1.2.4 විශේෂ තැන්පතු හා ආයෝජන

2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දක්වා තිබුණු රු.10,063,434 ක් වූ විශේෂ තැන්පතු ගිණුමේ ශේෂය ආයතන 75 කින් තැන්පතු ලෙස ලබාගෙන ඇති මුදල් සහ ඒවායින් උපයාගෙන ඇති පොලී වටිනාකම බව නිරීක්ෂණය විය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මෙම තැන්පතු ලබාගැනීමට පාදක වූ අරමුණු සම්බන්ධ ලිඛිත තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) තැන්පතු ලබා ගෙන ඇති ආයතනවල පැවැත්ම පිළිබඳව සොයා බැලීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය නොවූ අතර, එම තැන්පතු ආපසු ගෙවිය යුතු ඒවා බවද තහවුරු නොවුණි.

(ඇ) 1967 සිට ලබා ගෙන ඇති තැන්පතු මුදල් ඉතිරිකිරීමේ ගිණුම්වල ආයෝජනය කිරීමෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ලබා ගෙන ඇති පොලිය රු.10,604,999 ක් විය. මෙම පොලිය සහ තැන්පතුවල එකතුව වන රු.10,063,434 ක මුදල ආයෝජන ලෙසද විශේෂ තැන්පතු ලෙස, වගකීමක් ලෙස ශේෂ පත්‍රයේද අනාවරණය කර තිබුණි.

(ඇ) වර්ෂ ගණනාවක සිට මෙම මුදල් ඉතිරි කිරීමේ ගිණුම්වල ආයෝජනය කිරීම හේතුවෙන් ඉතා අඩු පොලී ආදායමක් උපයා තිබුණු අතර, අදාල මුදල් වෙනත් සුදුසු ආයෝජනයක යෙදීමට කටයුතු කර ඇති බවක්ද නිරීක්ෂණය නොවීය.

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැතිවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | විෂයය | මුදල<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | විවිධ ණයගැතියන් | 40,839,267 | ආයතන 178 කින් හිඟව පැවති ණයගැති ශේෂ වලට අදාල ශේෂ සනාථ කිරීම් |
| (ආ) | ගිණුම් විෂයන් 08 ක් | 8,747,573 | සනාථ කිරීම් සඳහා ලිපි ලේඛණ |

### 1.2.6 නීති,රීති, රෙගුලාසි වලට අනුකුල නොවීම

පහත සඳහන් අනුකල නොවීම් නිරීක්ෂණය විය.

(අ) 2001 අගෝස්තු 07 දිනැති අංක 15/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන්ගේ සේවයට පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා වේලා සටහන් යන්ත්‍ර හඳුන්වා දී තිබුණ ද, නිලධාරීන්ගෙන් බහුතරයක් වේලා සටහන් යන්ත්‍ර පරිහරණය කිරීම වෙනුවට එක් එක් ශාඛාවේ ලේඛණයක් පවත්වා එමගින් පැමිණීම හා පිටවීම වාර්තාකර තිබුණි.

(ආ) මු.රෙ. 175(2) ප්‍රකාරව හිඟ මුදල් එකතුකරනු ලබන නිලධාරීන් ඉතා සැලකිල්ලෙන් සිටිය යුතු බවට අවධාරණය කර ඇති අතර, අප්‍රමාදව නීති ප්‍රකාරව කටයුතුද කළ යුතු වේ. එහෙත් රු. 40,839,267 ක් වූ හිඟ මුදල් අයකිරීම සඳහා එසේ කටයුතු කර නොතිබුණි.

### 1.2.7 අධිකාරි බලයකින් සනාථ නොවන ගනුදෙනු

ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන්ට දිනකට පැය 12 සිට 27 දක්වා වූ කාල පරාසයක් තුල මසකට පැය 600 ඉක්මවා අතිකාල දීමනා ලබාගත හැකි වන පරිදි අවිධිමත් ලෙස අභ්‍යන්තර රෙගුලාසි පනවා තිබුණු අතර, ඒ සඳහා ලබාගත් විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. මෙම අතිකාල යෝජනා ක්‍රමය රජයේ පොදු රෙගුලාසි වලින් පාලනය වන ක්‍රියාවලියක් ද නොවිය. එසේම, මෙම වාර්තාවේ 2.2.7(ආ) ඡේදයේ සඳහන් පරිදි නිලධාරීන්ගෙන් බහුතරයක් වේලාසටහන් පත්‍ර භාවිතා නොකිරීම තුළ මෙම අතිකාල ගෙවීම්වල නවැරදිභාවය පිළිබඳ ප්‍රශ්නකාරී වේ

## 1.2.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ජුනි මාසයේදී අපනයන අංශයට අනුයුක්තව සිටි නිලධාරීන්ගෙන් 10 දෙනෙකු සම්බන්ධව සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී එම නිලධාරීන්ට මසකට පැය 650 ක් දක්වා අතිකාල දීමනා ගෙවා ඇති බව නිරීක්ෂණය විය. මෙසේ අතිකාල දීමනා ගෙවන කාලය තුලම බාහිර බහාලුම් පරීක්ෂණ කටයුතු වල යෙද වූ බවට වාර්තා කර එම නිලධාරීන්ටම මසකට රු.18,000 සිට රු.68,700 දක්වා වූ පරාසයක් තුල බාහිර බහාලුම් පරීක්ෂණ ගාස්තු දීමනා ද ගෙවා තිබුණි.

(ආ) අපනයන, බැදුම්කර සහ ගමන්බඩු යන අංශ වලින් පිළවෙලින් 2011 අප්‍රේල් සහ මැයි යන මාස වල ගෙවීම් තහවුරු කෙරෙන ලියවිලි විගණනයට ඉදිරිපත් කරන ලෙස දන්වා ඇතත් 2012 අගෝස්තු දක්වා අදාල තොරතුරු ඉදිරිපත් නොකෙරුණි. 2008 සහ 2009 වර්ෂවල මෙම තොරතුරු පරිගණකයෙන් මැක ගොස් ඇති බව වාර්තා කර තිබුණෙන් මෙම ගෙවීම් නිවැරදි බවට තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි. ඒ අනුව, රු.341,098,003 ක් වූ නැව්බඩු පරීක්ෂණ ගෙවීම්වල නිවැරදිතාවය සමාලෝචිත වර්ෂය තුළදී පරීක්ෂාවට ලක්කළ නොහැකි විය.

(ඇ) ඉහත සඳහන් පරිදි දීමනා ගෙවා ඇත්තේ නිලධාරීන්ගේ මාසික වැටුප්, දිරි දීමනා, අතකාල දීමනා හා ත්‍යාග මුදල් ආදියට අතිරේක වශයෙන. නිලධාරීන් බොහාමයකගේ අතිකාල ඉපයීම් මාසික ඒකාබද්ධ වැටුපද ඉක්මවා පැවතුණි. පවත්නා රෙගුලාසි අනුව එක් නිලධාරියකු වර්ෂයක් තුළදී සේවයේ යෙදවිය හැකි උපරිම අතිකාල පැය ප්‍රමාණය දළ වශයෙන් පැය 6,900 ක් පමණ වේ. නිලධාරීන මෙම උපරිම පැය ප්‍රමාණයෙන් 95% කට වැඩි ප්‍රමාණයක් අතිකාල සේවයේ යෙදවු බවට වාර්තා කර අතිකාල දීමනා ගෙවා ඇති අවස්ථා ද නිරීක්ෂණය විය. මේ අනුව බොහෝ නිලධාරීන් මුළු වර්ෂය පුරාම නිවාඩු ලබානොගෙන, පැය 24 පුරාම සේවයෙහි නියුක්තව සිට ඇති පදනම මත පිහිටා ගෙවීම් කර ඇති අතර, එය තාත්වික නොවේ.

(ඈ) අතිකාල දීමනා, බහාලුම් පරීක්ෂණ ගාස්තු, දිරිදීමනා හා ගමන් වියදම් යනාදී දීමනා ගෙවීමේ ක්‍රියාවලිය තුළ පවතින බරපතල අභ්‍යන්තර පාලන දුර්වලතා ඉකුත් වර්ෂ වලදී දිගින් දිගටම රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමුකර ඇති අතර, අවිධිමත් ක්‍රියාවලියක් තුලින් කරනු ලබන ඉහත ගෙවීම් මතභේදයට තුඩුදෙන ගනුදෙනු විය. මෙම තත්ත්වය විධිමත් කිරීම සඳහා අතිකාල දීමනා සහ බාහිර පරීක්ෂණ ගාස්තු සම්බන්ධ යල්පැන ගිය රෙගුලාසි සංශෝධනය කළ යුතු වුවත්, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ද ගෙන නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා රේගු අතිකාල හා නැව් බඩු පරීක්ෂණ ගාස්තු අරමුදල නමින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණද, අතිකාල අරමුදලට අදාල මූල්‍ය ප්‍රතිඵල පමණක් ආදායම් වියදම් ගිණුමේ දක්වා තිබුණි. කෙසේ වුවද, ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් අතිරික්තය රු.171,182,085 ක් වු අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වු අතිරික්තය රු.167,201,514 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.3,980,571 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. මෙම වර්ධනය සඳහා කොළඹ අවට පිහිටි රේගු කාර්යාලවලින් එකතු කර ඇති අතිකාල ආදායම්වල 14% ක වර්ධනයක් මූලික වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

#### (අ) අතිකාල අරමුදල

රේගු කාර්ය මණ්ඩලයේ සාමාන්‍ය රාජකාරි වේලාවට අමතර කාලය තුල සහ රාජකාරි සඳහා රේගුව වසා ඇති දිනවල දී රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් දරන වියදම ආවරණය කිරීම සඳහා බාහිර නිශ්කාෂණ මධ්‍යස්ථාන හා අනෙකුත් ආයතනවලින් අතිකාල මුදල් වශයෙන් අය කෙරෙන මුදල් මෙම අරමුදලට බැර කරන අතර, එකී අතිකාල සේවා වෙනුවෙන් රේගු කාර්ය මණ්ඩලයට කරන ගෙවීම් මෙම අරමුදලේ වියදම් ලෙස සැලකේ.

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය හා ඉකුත් වර්ෂ 07 කට අදාල අතිකාල අරමුදලේ මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| වර්ෂය | ආදායම | වියදම | අතිරික්තය | ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය/ (පිරිහීම) ප්‍රතිශතයක් ලෙස | අතිරික්තය ආදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු.මිලියන | රු. මිලියන | රු.මිලියන | | |
| 2003 | 314.442 | 257.511 | 56.931 | - | 18.11 |
| 2004 | 336.786 | 302.717 | 34.069 | (40.15) | 10.12 |
| 2005 | 381.696 | 367.750 | 13.946 | (59.06) | 3.65 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2006 | 490.012 | 384.789 | 105.223 | 654.52 | 21.47 |
| 2007 | 576.415 | 425.920 | 150.495 | 43.02 | 26.11 |
| 2008 | 576.671 | 424.275 | 152.396 | 1.26 | 26.43 |
| 2009 | 465.837 | 410.236 | 55.602 | (64) | 12.00 |
| 2010 | 583.491 | 416.289 | 167.202 | 200 | 28.64 |
| 2011 | 593.065 | 421.883 | 171,182 | 2.38 | 28.86 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදී අරමුදලින් කාර්ය මණ්ඩලය වෙත දරා ඇති වියදම රු.362,297,078 ක් ව අතර, ඉකුත් වර්ෂයේදී එය රු.357,895,120 ක් විය. ඉදිරිපත් වු තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ශ්‍රී ලංකා රේගුවේ සමස්ථ කාර්ය මණ්ඩලය 1990 ක් ව අතර, අරමුදලේ වාර්ෂික ඒක සේවක සාමාන්‍ය අතිකාල පිරිවැය රු.182,059 ක් විය. ඒක සේවක සාමාන්‍ය අතිකාල පිරිවැය ගණන් බැලීමේදී ශ්‍රී ලංකා රේගුවේ වැය ශීර්ෂය යටතේ ඒකාබද්ධ අරමුදලන් දරන ලද අතිකාල වියදම් ඇතුළත් කර නොමැත. 2011 වර්ෂය සඳහා දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ දරන ලද අතිකාල පිරිවැය රු.1,893,780 කි.

(ii) ශ්‍රී ලංකා රේගුවේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් සමාලොචිත වර්ෂය තුල අතිකාල අරමුදලින් අතිකාල වියදම් දරා තිබියදී අතිකාල අරමුදලේ අතිරික්තය ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) රේගු නැව්බඩු පරීක්ෂණ ගාස්තු අරමුදල

-----------------------------------------

රේගු නිලධාරීන් විසින් සාමාන්‍ය රාජකාරී ස්ථානයෙන් බැහැරව පරීක්ෂණ රාජකාරී වල යෙදීම වෙනුවෙන් , භාණ්ඩ නිශ්කාශණය කරගනු ලබන පාර්ශවයන් වෙතින් අයකරන පරීක්ෂණ ගාස්තු වලින් 50% ක් රේගු නැව් බඩු පරීක්ෂණ ගාස්තු අරමුදලට බැර කරන අතර, එම මුදල් නිලධාරීන්ට දීමනා ගෙවීම සඳහා භාවිතා කරනු ලබයි. සමාලෝචිත වර්ෂය තුළ මෙපරිදි රු.223,521,968 ක් අරමුදලට ලැබී තිබුණු අතර, ඉදිරියට ගෙනා ශේෂයද ඇතුළු මුළු මුදල රු.593,167,825 ක් විය. සමාලෝචිත වර්ෂය තුල දරන ලද වියදම රු.341,098,003 ක් විය. ඉකුත් වර්ෂය අවසානයේදී රු.369,645,857 ක් වු අරමුදලේ තැන්පතු ප්‍රමාණය සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.252,069,822 ක් දක්වා අවප්‍රමාණය වී තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

අරමුදලේ පරිහරණය නොකළ මුදල් භාණ්ඩාගාර තැන්පතු ලෙස වර්ෂයෙන් වර්ෂය ඉදිරියට ගෙනවිත් තිබුණු අතර, එම තැන්පතු ගිණුමේ ශේෂය සහ අරමුදල් ශේෂයන් පහත දැක්වෙන පරිදි වර්ධනය වීමක් පෙන්නුම් කෙරිණි. එම මුදල් පිළිබඳව භාණ්ඩාගාරය සමහ සාකච්ජා කර අවශ්‍ය පියවර ගෙන නොමැති බැව් නිරීක්ෂණය විය.

| වර්ෂය | අතිකාල අරමුදල | නැව්බඩු පරීක්ෂණ ගාස්තු අරමුදල | භාණ්ඩාගාර තැන්පතු ගිණුමේ ශේෂය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 2005 | 28,007,949 | - | 28,007,949 |
| 2006 | 254,940,825 | 93,672,857 | 348,613,682 |
| 2007 | 451,423,786 | 157,259,952 | 608,683,738 |
| 2008 | 616,810,938 | 246,576,326 | 863,387,264 |
| 2009 | 669,350,013 | 322,004,787 | 991,354,800 |
| 2010 | 849,082,264 | 369,645,856 | 1,218,728,121 |
| 2011 | 1,022,822,795 | 252,069,822 | 1,274,892,617 |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### අයවැය ලේඛණමය පාලනය

අයවැය ලේඛනය අනුව ආදායම් හා වියදම් සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර ප්‍රමාණාත්මක විචලනයන් අනාවරණය වුයෙන් අයවැය ලේඛනය ඵලාදායි කළමණාකරන පාලන කාරකයක් ලෙස යොදාගෙන නොමැති බැව් නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදි නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර රේගු අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) අයවැය

(ආ) සේවක මණ්ඩල

(ඇ) හිඟ ආදායම්

(ඇ) අතකාල හා බහාලුම් පරීක්ෂණ ගාස්තු

(ඉ) ගිණුම්කරණය